269

# ශ්‍රී ලංකාවේ තේ වතු පෞද්ගලිකරණය තුළින් ඇති වූ සමාජ ආර්ථික බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

ජී.එම්. සිරිවර්ධන
බී.ඒ. (කොළඹ)

කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

සමාජීය විද්‍යාපති පාඨමාලාව - 1998 (ආර්ථික විද්‍යා) දෑ අවුරුදු පරීක්ෂණයේ පාර්ශවීය අවශ්‍යතාවයක් සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ නිබන්ධිකාව

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 269 |
| වර්ග අංකය | |

කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
- 2000 දෙසැම්බර් -

# <u>නිබන්ධ සාරාංශය</u>


ව්‍යාපාරික වතු වගාව ආරම්භ විමට පෙර ශ්‍රී ලංකාවේ පැවතියේ ස්වයංපෝෂිත ග්‍රාමීය ආර්ථික ක්‍රමයකි. එහෙත් ව්‍යාපාරික වතු වගාවේ ව්‍යාප්තියත් සමඟ එතෙක් පැවති ආවෘත ස්වයංපෝෂිත ආර්ථික රටාවට අමතරව ආයාත නිර්යාත පදනම් කරගත් ආර්ථික රටාවක් ද බිහිවිම තුළින් මෙරට ආර්ථිකයේ ද්විත්ව ලක්ෂණයක් වර්ධනය විය.

මෙරට ව්‍යාපාරික වතු වගාව ආරම්භයේ සිටම අවම රාජ්‍ය දායකත්වයක් සහ උපරිම පෞද්ගලික දායකත්වයක් මත පවත්වාගෙන ගියද, විවිධ දේශපාලනමය ආර්ථික හා සමාජිය හේතුමත 1970 දශකයේදී වතු වගාව රජයට පවරා ගනිමින් ජනසතු කරන ලදි. අනතුරුව විවිධ රාජ්‍ය ආයතන මාර්ගයෙන් වතු වගාව පවත්වාගෙන යාමට උත්සාහ දරුවත් ආකාර්යක්ෂම කළමණාකරණය හා අධික ණය බර හේතුවෙන් මෙරට වතු වගාව විශාල කඩා වැටිමකට භාජනය විය. මෙම තත්වය යටතේ තවදුරටත් රාජ්‍ය හිමිකාරත්වය මත වතු වගාව පවත්වාගෙන යාම අසිරු වු හෙයින් 1992 වර්ෂයේදී ශ්‍රී ලංකා රජය විසින් වතු වගා අංශය ප්‍රතිව්‍යුහ ගත කිරිමේ වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදි. මෙම වැඩපිළිවෙලේ අවසන් අධියර වුයේ 1997 වර්ෂය වනවිට පෞද්ගලික සමාගම් 23 ක් විසින් රාජ්‍ය ව්‍යවසාය යටතේ පැවති වතුවල කොටස් අයිතිය හා පරිපාලනය සම්පුර්ණයෙන්ම භාර ගැනිමයි.

මෙම අධ්‍යනයේ විශ්ලේෂණය අනුව සමස්ථයක් වශයෙන් සලකන විට ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායකත්වය යටතේ පැවති තේ වතු පෞද්ගලිකරණ වැඩපිළිවෙල තුළින් පොදුවේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය හා සමාජයිය තත්වයන්ට ද විශේෂයෙන් වතු ප්‍රජාවේ ආර්ථික හා සමාජ තත්වයටත් වඩා ඵලදායි සුබවාදි බලපෑමක් සිදුවී ඇති බව නිගමනය කළ හැකිය.